# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2323/46 – 2023 මාර්තු මස 18 වැනි සෙනසුරාදා – 2023.03.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/13/28/2013.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.11.19 දිනැති හා අංක 2306/88 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.11.14 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පාලටුව, වැල්ලේතොට, "සරාගී" හි පදිංචි එච්.කේ.එන්.එස්. හේරත් මයා සහ 1. කොළඹ 05, කිරුල පාර, නො.200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2. මුලටියන, හක්මණ ඩිපෝව හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.02.22 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මාර්තු මස 02 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 39128 – 18 (2023/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය - කොළඹ.

1. එච්.කේ.එන්.එස්. හේරත් මහතා.
"සරාගී" වැල්ලෙතොට,
පාලටුව.

*පළමු පාර්ශ්වය*

යොමු අංකය: A /75/ 2022

1R /13/28/2013

සහ

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
හක්මණ ඩිපෝව,
මුලටියන.

*දෙවැනි පාර්ශ්වය*

*අතර පවතින කාර්මික ආරාවුල*

ප්‍රදානයයි

ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක. 4 හා 1968 අංක 39 ( 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) දරන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍යවරයාට පැවරී ඇති බලතල අනුව 2022.11.14 දින හා අංක IR/ 13/28/2013 ලිපියෙන් මා බේරුම්කරු වශයෙන් පත්කොට මා වෙත යොමුකර ඇත.

ආරාවුලට තුඩු දුන් කාරණය

බේරුම්කරණය සඳහා මා වෙත යෙමුකර ඇති උක්ත නියෝගය ප්‍රකාරව පහත සඳහන් දෙපාර්ශ්වය අතර, උද්ගතවී ඇති කාර්මික ආරාවුලයි.

1. එච්.කේ.එන්.එස්. හේරත් මහතා.
"සරාගී" වැල්ලෙතොට,
පාලටුව.

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
හක්මණ ඩිපෝව,
මුලටියන.

මෙම ආරාවුලට හේතුවී ඇති කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් නීතිඥ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා විසින් නිකුත් කරන ලද ඔහුගේ අංක IR/ 13/28/2013 හා 2022.11.03 ලිපිය අනුව "ශ්‍රී ලංකා ගමනාගමන බල මණ්ඩලයේ හක්මණ ඩිපෝවේ සහකාර කලමණාකාර ඉංජිනේරුවරයෙකු වශයෙන් සේවයේ නිරතව සිටි එච්.කේ.එන්.එස්. හේරත් මහතාට 2011.08.27 දින සිට වේතන රහිතව සේවය තහනම් කර විනය පරීක්ෂණයෙන් අනතුරුව ලබා දුන් දඬුවම් තුළින් අසාධාරණයක් සිදුවූයේද? ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව'' වේ.

බේරුම්කරන විභාගයේ පසුබිම හා එය පැවැත්වූ ආකාරය

මෙම කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු වශයෙන් එස්.සී.ආර්.ඒ. උපාලි නිශ්ශංක ගුණසේකර මහතා පත්කර සිටි ඇති අතර, ඒ මහතා බේරුම්කරණ ධුරයෙන් ඉල්ලා අස්වී ඇති බව A/73/2021 දරන ගොනුවෙන් පැහැදිලි වේ. තවදුරටත් පැහැදිලි වන්නේ එම බේරුම්කරණය යටතේ පළමු හා දෙවන පාර්ශ්ව වල පළමු ප්‍රකාශය ගොනු කිරීමෙන් පසු මෙසේ ඉල්ලා අස්වී ඇති බවයි. ඒ අනුව මෙම බේරුම්කරණයට වර්ෂ 2 ක් පමණ දැනට ගතවී ඇති බව පෙනී යයි.

මෙම බේරුම්කරණය පළමු පාර්ශ්වය නියෝජනය කරමින් නියෝජිත පී.එම්. තිලකසිරි මහතා පෙනී සිටි අතර, දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ ශානිකා ගාල්ලගේ මහත්මිය, නීතිඥ හාජර් අසාර් මෙනවිය හා නීතිඥ චිරස්ථී සෙනෙවිරත්න මහත්මිය පෙනී සිටි අතර ඇතැම් අවස්ථාවල නීතිඥ මණ්ඩලයේ සංයුතිය වෙනස්ව පැවති බවද සඳහන් කරමි.

මෙම බේරුම්කරණය සියුම් නීතිගරුක ඇතැම් ලේඛන ඔප්පු කිරීමේ භාරයට යටත්කිරීමේ උත්සාහයන් ද, ඇතුළත් බේරුම්කරණයක් බව සඳහන් කරමි. මෙම බේරුම්කරණය සාමාන්‍ය අධිකරණ ක්‍රියාවලියෙන් බැහැරව මා හට ලබාදෙන ලද ලිඛිත උපදෙස් පරිදි නියමිත කාලය තුළ මෙම බේරුම්කරණය අවසන් කිරීමට ඇති අවශ්‍යතාවය හා රටේ වත්මන් ආර්ථික අර්බුදයද සැලකිල්ලට ගනිමින් ඒ පිළිබඳව දෙපාර්ශ්වයම දැනුවත් කළ අතර, අවශ්‍ය සහයෝගය ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

මෙම බේරුම්කරණයේ දී පළමු පාර්ශ්වය විසින් පැ 1 සිට පැ 17 දක්වාත් දෙවන පාර්ශ්වය විසින් ඉංග්‍රීසි අකුරු R 1 සිට R 9 දක්වා ද ලකුණු කරන ලද ලේඛන ඒවායේ අතුරු ලේඛන සහ සටහන් අනු අංක හා එක් පාර්ශ්වයක් විසින් ස්වකීය පාර්ශ්වය වෙනුවෙන් නඩු විභාගයේ දී සාක්ෂිවලදී ලකුණු කළ ඇතැම් ලේඛන අනෙක් පාර්ශ්වය විසින් ස්වකීය ලේඛන ලෙස ලකුණු කළ අවස්ථා ද විය.

පහත සඳහන් දිනයන් යටතේ නඩු අංක A/75/2022 යටතේ කාර්මික අධිකරණයට කැඳවීම් කර විභාග පවත්වා ඇත.

| | |
|---|---|
| 2022.11.28 | 2023.01.03 |
| 2022.12.02 | 2023.01.10 |
| 2022.12.15 | 2023.01.17 |
| 2022.12.28 | 2023.01.26 |
| | 2023.02.07 |

මෙම නඩුවේ ඉල්ලුම්කරු වන හේවාකාර්තුගේ නෙවිල් ශ්‍රී හේරත් මහතා 1988.10.01 වැනි දින II පෙළ මෝටර් කාර්මිකයෙකු වශයෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට සේවයට බැඳී ඇත. (R 1 ) ඉන් පසුව 1999.09.01 වන දින සිට II පෙළ කාර්මික රියදුරු තනතුර ලැබී ඇති අතර, 2000.08.10 වැනි දින viiiA ශ්‍රේණියේ පෝර්මන් තනතුරකට උසස් කර ඇත. (R 2)2002.04.08 වන දින සිට V ශ්‍රේණියේ සහකාර කළමනාකරු ඉංජිනේරු වශයෙන් උසස් කර ඇති අතර, මේ දක්වා අදාළ ශ්‍රේණියේ කටයුතු කරන බව අනාවරණය විය.

මොහු සහකාර කළමණාකරණ ඉංජිනේරු වශයෙන් හක්මණ ඩිපෝවේ සේවය කරමින් සිටින විට 2011.05.10 වැනි දින එම ඩිපෝවට අයත් අංක 61/9258 දරන බස් රථය අනතුරකට ලක්වීමට අදාළව 2011.08.16 වැනි දින වැඩ තහනමකට ලක් වූ බව ඉල්ලුම්කරු තමාගේ පළමු ප්‍රකාශයෙන් කියා සිටී. (පැ 4)

මෙම අනතුර සම්බන්ධයෙන් 2022.12.02 දින කාර්මික අධිකරණයේ දී පැවති විභාගයේ දී ඔහුගෙන් ප්‍රශ්න කිරීමේදී පහත සඳහන් කරුණු අනාවරණය විය. (පි 13)

අධිකරණය

ප්‍ර මොකක් සම්බන්ධයෙන් ද? විනය පරීක්ෂණයක් පැවැත්වූයේ?

පි බස් රථයක ධාවනයේ දී ඉදිරි දකුණු රෝදය ගැලවී ගොස් බස් රථය අනතුරකට පත් වුණා. ඒ සම්බන්ධව, මම ක්‍රියාමාර්ගයක් ගත්තේ නැහැ කියන එක තමයි මට තියෙන චෝදනාව. එවකට හිටියේ දීප්ති කමල් මහතා.

මෙම නඩු විභාගයට අදාළව 2022.12.15 වැනි දින පළමු පාර්ශ්වයේ නියෝජිත මහතා විසින් ඉල්ලුම්කරුගෙන් කරන ලද ප්‍රශ්න වලට ආදාළව පහත සඳහන් විභාග සටහන් ඉදිරිපත් කරමි.

ප්‍ර ඉල්ලුම්කරු 2011.10.11 වන දින ඩිපෝ කළමනාකරු ඔබට විශේෂිත ලිඛිත රාජකාරියක් පවරා තිබුණාද?

පි මම දැනුවත්ව එසේ පැවරීමක් කර නැහැ.

ප්‍ර ඔබ හක්මණ ඩිපෝවේ ඉංජිනේරු අංශයේ සේවය කරමින් සිටියදී ඔබට වුණ සිද්ධිය කුමක්ද?

පි මම ඩිපෝ ඉංජිනේරු තනතුරේ නෙමේ හිටියේ එම තනතුරට වෙනත් කෙනෙක් සිටියා.

මෙම සිද්ධියට මම අදාළ නැහැ. කළමණාකාරීත්වය දුර්වල නිසා බස් රථ නඩත්තු නොකිරීම නිසා වුණ ආපදාවක් එය මට අදාළ නැහැ. එවිට භාරව සිටි දීප්ති කමල් ඉංජිනේරු මහතෙක් සිටියා. එම අවස්ථාවේ තමයි බස් එකේ රෝද කඩාගෙන ගිහින් අනතුරු වෙලා තිබෙන්නේ. එයට වගකිව යුතු නිලධාරියාගේ නම කපලා මගේ නම දාලා තියෙන්නේ. (2022.12.15 විභාග සටහන් පිටු අංක 49)

ඉල්ලුම්කරු නඩු විභාගය ආරම්භයේ සිටම අවසානය දක්වාම සඳහන් කරේ මෙම බස් රථයේ අනතුර සිදුවන විට තමාට ඉහළින් සිටි සහකාර කළමනාකාර ඉංජිනේරු එස්.ටී. දීප්ති කමල් මහතා කටයුතු කළ බැවින් මෙම චෝදනාව ඔහුට අදාළ බවයි.

2023.01.17 දින අධිකරණයේ දී දෙවන පාර්ශ්වය විසින් කරන ලද හරස් ප්‍රශ්න පහතින් සටහන් කරමි. (පිටු අංක 143-144)

ප කුමන තනතුරකටද? වැටුප් ලැබෙන්නේ ?
පි සහකාර කළමනාකරු ඉංජිනේරු කියන තනතුරට වැටුප් ලැබුණා.
ප්‍ර තමන්ට හා රත්නපාල යන අයට වැටුප් ලැබෙනවා.
පි ඔව්.
ප්‍ර ඉන් පසු තව කෙනෙක් පත් වුණාද?
පි දීප්ති කමල් කියන මහතා ආවා. සහකාර කළමනාකරු ඉංජිනේරු ලෙස
ප්‍ර මෙම සිද්ධිය වන විට තුන් දෙනෙක් සිටියා.
පි රත්නපාල විශ්‍රාම ගියාට පසුව එතනට දීප්ති කමල් කියන මහත්මා කළමණාකරණ සහකාර ඉංජිනේරු ලෙස පත්වුණා.
ප්‍ර තමාගේ රාජකාරීවලට කවුරු හෝ උපදෙස් ලබා දෙනවාද?
පි ඩිපෝවේ ඉන්න සහකාර කළමනාකාර ඉංජිනේරු කියන දෙයක් තමයි මම කළේ
ප්‍ර එම නිලධාරියාගේ නම කුමක්ද?
පි දීප්ති කමල්

මේ අනුව පෙනී යන්නේ සහකාර කළමනාකාර ඉංජිනේරු දීප්ති කමල් මහතාගේ උපදෙස් අනුව ඉල්ලුම්කරු කටයුතු කළ යුතු බවයි. ඉල්ලුම්කරු යටත් නිලධාරියෙකු වන අතර, ඉල්ලුම්කරුගේ ආසන්නතම අධීක්ෂණ නිලධාරියා වශයෙන් සහකාර කළමනාකාර ඉංජිනේරු දීප්ති කමල් මහතා කටයුතු කළ බව මේ අනුව පෙනී යයි.

2023.01.17 දින ඉල්ලුම්කරුගේ නියෝජිත විසින් ලේඛනයක් පෙන්වා සිටී.

ප්‍ර ඔබ මෙම ලේඛනය දැක තිබෙනවාද? කුමක් සඳහා ගත් ලේඛනයක්ද?
පි ඔව්, දේශපාලන පලිගැනීම් එකට ඉදිරිපත් කළ ලේඛනයක්

අදාළ ලේඛනය ඉල්ලුම්කරු විසින් දේශපාලන පලිගැනීම් කමිටුවට ඉදිරිපත් කරන ලද ලේඛනයක් වන අතර එය හක්මණ ඩිපෝවේ කළමනාකාර තැන විසින් නිල මුද්‍රාව හා තම අත්සන සහිතව ලබා දී ඇති බව පෙනී යයි. ( සාක්ෂිකරු එම ලිපියේ මාතෘකාව කියවා සිටී.) පිටු අංක 153
එම ලිපිය (පැ 15) වශයෙන් සලකුණ කර ඉදිරිපත් කර සිටිනවා.

දෙවන පාර්ශ්වය එම ලේඛනය පිළිගැනීමට නොහැකි බව ප්‍රකාශ කර සිටී.

<u>අධිකරණය</u>
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ හක්මණ ඩිපෝව, මුලටියන ඩිපෝ අධිකාරි තැන විසින් නිකුත් කරන ලද මගේ අංක ශ්‍රී ලංගම/හක්/දා/01/2016 හා 2016.06.02 දින දරන ලිපිය සනාථ කර ගැනීමේ හැකියාව දෙවන පාර්ශවයට ඇති බව ප්‍රකාශ කර සිටී.

අදාළ ලිපියෙන් එච්.කේ.එන්.එස්. හේරත් මහතා V නිලධාරි මහතෙකු වශයෙන් සේවය කරන අතර, ඔහුට සහකාර කළමනාකාර ඉංජිනේරු තනතුර ලබා දී නොමැති බව තහවුරු කර ඇත.

දෙවන පාර්ශවය විසින් කියා සිටින්නේ එය ඔවුන්ගේ සන්තකයට ආවේ කෙසේද යන්න තහවුරු කළ යුතු බවයි. (පිටු අංකය 153)

මෙම ලිපිය පළමු පාර්ශවය විසින් තහවුරු කිරීමට ක්‍රමවේදයක් නොමැති බැවින් එම ලිපිය ඉල්ලුම්කරුට දේශපාලන පලිගැනීම් කමිටුවට බාරදීම සඳහා ඩිපෝ කළමනාකාර හක්මණ ඩිපෝව මඟින් ලබා දෙන ලද ලේඛනයක් බව කියා සිටී.

<u>අධිකරණය</u>

දෙවන පාර්ශ්වයේ යෝජනාව ප්‍රතික්ෂේප කරන අතර, අදාළ ලියවිලිවල සත්‍ය අසත්‍යතාවය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අදාළ ලියවිලිවලින් සනාථ කර ගැනීමේ හැකියාව ඇති බවට සඳහන් කරමි.

<u>නිරීක්ෂණ හා නිගමනයන්</u>

ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් (පැ 07) වශයෙන් මෙම අධිකරණයට ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය හා ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලීය විනය ව්‍යවස්ථා මාලාවේ 6. සේවය තහනම් කිරීම හී 6.1 යටතේ "කෙසේ වෙතත් විභාගය අවසානයේ දී සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමට වඩා අඩු දඬුවමක් පමුණුවන ලද හොත් මුළු වැටුප හෝ ඉන් කොටසක් හෝ ආපසු ගෙවීම නියමිත බලධාරියාට නියෝග කළ හැක." යනුවෙන් සඳහන්ව ඇත. ඒ අනුව ඉල්ලුම්කරුගේ වැඩ තහනම් කර සිටි කාලය වන මාස 10 ට අදාළව එම ව්‍යවස්ථාවේ සඳහන් කරුණු ක්‍රියාත්මක නොවීමෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බව පෙනී යයි. (පිටු අංකය 211)

තවද 2011.08.16 වැනි දින දරන ශ්‍රී ලංගම/මාසක/විනය/110/2011 (116) දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කළමනාකරණ (විනය) ලිපිය අනුව එච්.එන්.එස්.කේ. හේරත් මහතාගේ සේවය වේතන රහිතව තහනම් කර ඇත. එමෙන්ම චෝදනා පත්‍රය 2011.09.14 වැනි දින නිකුත් කර ඇති අතර, විනය නියෝගය ලබා දී ඇත්තේ 2012.05.29 වැනි දිනය. මේ අනුව ඒ සඳහා මාස 08 කාලයක් ගත වී තිබීමෙන් ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලීය හා ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලීය විනය ව්‍යවස්ථා මාලාවේ 4.6 පරිදි කටයුතු කර නොමැති බව පෙනී යයි. මෙම කොටස ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් (පැ 07) හි C වශයෙන් පෙන්වා ඇත. (පිටු අංක 210)

මෙම ඉල්ලුම්කරුට විරුද්ධව පැවැති මෙම විභාගයේ දී ඔහු වෙනුවෙන් පෙනී සිටි මිතුරා වන ඒ. විට්ටච්චි මහතා විසින් පෙන්වා දී ඇත්තේ "අංක ශ්‍රීලංගම/හක්/පරීක්ෂණ/2011 හා 2011.06.27 දිනැති පිටු 07 කින් යුත් වාර්තාවේ අවසානයේ ඇති සටහනක් පිළිබඳව එනම් එච්. කේ. එන්. එස්. හේරත් මහතා සහකාර කළමනාකරු ඉංජිනේරු වශයෙන් ද, එස්. පී. දීප්ති කමල් මහතා සහකාර කළමනාකාර ඉංජිනේරු (අතිරේක) වශයෙන් සටහන් කර තිබීමයි. සත්‍ය වශයෙන්ම මෙය පටලවා ඉදිරිපත් කිරීමකි. හේරත් මහතාට සහකාර කළමනාකාර ඉංජිනේරු දීමනාව නොගෙවීමත් දීප්ති කමල් මහතාට සහකාර කළමනාකාර ඉංජිනේරු දීමනාව දීමෙනුත් මා කියා සිටින කරුණු පැහැදිලි වනු ඇතැයි මා විශ්වාස කරමි." යනුවෙන් (පැ/04) හි විභාග සටහන්වල දක්නට ඇත. (පිටු අංක 202)

(පැ15) ලිපිය අනුව හක්මණ ඩිපෝවේ ඩිපෝ කළමනාකරු විසින් ඔහුගේ අංක ශ්‍රීලංගම/හක්/ධා/01/20216 දරන ලිපියේ සඳහන් කරුණු 2005 ජනවාරි මස සිට එම ලිපිය නිකුත් කරන දිනය දක්වා ම මෙම ඩිපෝවේ සහකාර කළමනාකාර ඉංජිනේරු වශයෙන් V නිලධාරි එස්.පී. දීප්ති කමල් මහතා කටයුතු කරන බව තහවුරු කර ඇත. එමෙන්ම එච්.කේ. එන්. එස්. හේරත් මහතා" V නිලධාරි මහතෙකු වශයෙන් මෙම ඩිපෝවේ සේවය කරන බවද ඔහුට සහකාර කළමනාකාර ඉංජිනේරු තනතුර ලබා දී නොමැති බව ද, තහවුරු කර ඇත. (පැ 15) පිටු අංක 241

එමෙන්ම ඉල්ලුම්කාර පාර්ශ්වයේ (පැ 08) හි A වශයෙන් සලකුණු කරන ලද උපදෙස් ( විනය) අංක 1 (1972 හා 1975 ක් වූ අප්‍රේල් මස 29) වැනි දින දරන ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවක කළමනාකාර තැනගේ IV ව්‍යවස්ථාව යටතේ පවතිනා විනය විභාග වලට අදාළ (10) යටතේ විනය විභාග කල් දැමීමට අදාළ උපදෙස් මාලාවේ (II) පරිදි "සේවය තහනම් කළ සේවකයකු විනය විභාගයක් පැමිණිලි පක්ෂයේ සාක්ෂිකරුවන්ගේ නොපැමිණීම හෝ පැමිණිලි පක්ෂය සූදානම් නොවීම වැනි කරුණු උඩ පමණක් වෙනත් නොවැළැක්විය හැකි කරුණක් නොමැතිව (උසාවියේ නඩුවක් තිබීම. පොලිසියේ පරීක්ෂණ අවසන් නොවීම) වැනි කරුණු මාස 03 ක් ඇතුළත ආරම්භ කිරීමට නොහැකි වුවහොත් එම සේවකයා සේවය ප්‍රතිස්ථාපනය කිරීමට හෝ ඔහුට පඩි ගෙවීමට හෝ සලකා බැලීම සඳහා විස්තර වාර්තාවත් සමග විනය ලිපි ගොනුව නොපමාව සේවක මණ්ඩල කළමනාකාර තැනට එවිය යුතුය."

එම වගන්තිය අනුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය කටයුතු නොකිරීමෙන් එම වගන්තිය උල්ලංඝනය කර ඇති බව පෙනී යයි. (පිටු අංකය 229)

මෙම පරීක්ෂණයේ දී ඉල්ලුම්කරු වන එච්.කේ.එන්. එස්. හේරත් මහතාට රාජකාරී ලැයිස්තුවකින් රාජකාරි පරා තිබූ බවට දෙවන පාර්ශ්වය විසින් ඩිපෝ කළමනාකාර, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, හක්මණ ඩිපෝව මගින් නිකුත් කර තිබූ 2011.01.11 (R4) ලිපිය අධිකරණයට ඉදිරිපත් කළත් එම ලිපිය මෙම අනතුර හා සම්බන්ධතාවයක් නොමැති බව නිරීක්ෂණය විය. තවද එම ලිපිය මගින්

ඩිපෝ කළමනාකරු අපේක්ෂා කර ඇත්තේ "මෙම ඩිපෝවට ලැබෙන ආදායමට වඩා අධික වියදමක් ඉන්ධන, එන්ජින් තෙල්, ටයර් සහ අමතර කොටස්වලට වැය වන බව ඉදිරිපත් නොවන සංඛ්‍යා ලේඛන අනුව පෙනී යන බැවින් ඒ සඳහා පුළුල් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා එම වියදම අවම කර ගැනීම සඳහාත් ගත යුතු පියවරයන් පිළිබඳව කටයුතු කිරීම සඳහා 2011.01.11 වැනි දින සිට ඔබ පත් කිරීමට මෙම ඩිපෝවේ කළමණාකාරීත්වය තීරණය කර ඇත''. ඒ අනුව සහකාර කළමනාකාර ඉංජිනේරු තැන විසින් පවරන ලද කාර්යන්ට අමතරව පහත සඳහන් විෂය පිළිබඳව පූර්ණ අවදානය යොමු කොට අවශ්‍ය පියවර ගන්නා ලෙස දැනුවත් කරමි යනුවෙනි. ඒ අනුව 1 අංක සිට 4 දක්වා විශේෂ රාජකාරියක් පවරා ඇත. (පිටු අංකය 185-194)

මෙම ලිපියේ සඳහන් කරුණු අනුව කරුණු දෙකක් අනාවරණය විය.

1. එනම් එච්.කේ. එන්. එස්. හේරත් මහතා සහකාර කළමනාකාර ඉංජිනේරු නොවන බව වඩාත් තහවුරු වන්නේ සහකාර කළමනාකාර ඉංජිනේරු පවරන ලද කාර්යයන්ට අමතරව, මෙම රාජකාරිය පැවරීමයි.

2. මෙම විශේෂිත රාජකාරි පැවරුම හා සිදු වූ අනතුර අතර, ඔහුගේ සම්බන්ධතාවයක් නොමැති බවය.

2022.12.22 බේරුම්කරණ අංශයේ සහකාර කොමසාරිස් විසින් සාමාන්‍ය අධිකාරී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය කොළඹ 05 වෙත යවන ලද 2012.12.20 දරන ලිපියෙන් දෙවන පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ සඳහන් පහත සඳහන් ලිපි ලේඛන 2022.12.24ට පෙර කාර්මික අධිකරණයට භාරදීමට කටයුතු කරන ලෙසට දැනුම්දී ඇත. (පිටු අංක 45)

I 01, 02, 03, 04, 05, 06, 07, 08, 11, වලට අදාළව සඳහන් ලිපි,

II 2011.06.28 හක්මණ ඩිපෝවේ ආරක්ෂක පරීක්ෂක තැනගේ අංක ශ්‍රීලංගම /හක් /පරි/ආප/2011 හා 2011.06.27 වැනි දින දරන විමර්ශන වාර්තාව,

III අභියාචනා විභාග කරන ශ්‍රීලංගම අනුකාරක සභාවේ මෙම කරුණට අදාළ මාර්ග සටහන්,

IV 61-9258 බස් රථයට 2011.05.10 වැනි දින සිදු වූ අනතුරට අදාළ හානිය පිළිබඳ වාර්තාව.

ඉහත ලිපි අධිකරණයට ඉදිරිපත් කිරීමට දෙවන පාර්ශවය දැනුවත් කළත් ඒ සම්බන්ධව ලිඛිතව දැනුවත් කළත් දෙවන පාර්ශවය විසින් අධිකරණයේ සඳහන් කළේ මෙම විනය ලිපි ගොනුව අස්ථානගත වී ඇති බවයි. (පිටු අංක 90, 99, 116, 121. 122. 123)

එබැවින් දෙවන පාර්ශ්වයේ ලිඛිත දේශනයේ 3.2 ඡේදයේ සඳහන් කෙටි කාල සීමාවක් ලබා නොදීම යන්න පිළිගැනීමට නොහැකි බව සඳහන් කරමි. (පිටු අංක 109)

මෙම බේරුම්කරණයට අදාළව අධිකරණයේ දී දෙපාර්ශවය ඉදිරිපත් කළ කරුණ මෙන්ම ලකුණු කළ ලේඛන ද මාගේ සැලකිල්ලට බඳුන් වූ අතර, ඉල්ලුම්කරුවන V නිලධාරී එච්.කේ.එන්.එස්. හේරත් මහතා V නිලධාරී වශයෙන් කටයුතු කරමින් සිටියදී ඔහු සහකාර කළමනාකාර ඉංජිනේරු වශයෙන් හඳුන්වා දීමත්, ඒ අනුව ඔහුට චෝදනා පත්‍ර ලබාදීම හා විනය පරීක්ෂණ පැවැත්වීම තුළින් දඬුවම් ලබාදීම යුක්ති සහගත නොවන බවට නිගමනය කරමි. මේ බව හක්මණ ඩිපෝවේ ඩිපෝ කළමනාකාර තැනගේ 2016.06.02 දින දරන සභාපති, දේශපාලන පළිගැනීම් කමිටුව අමතන ලද ලිපියෙන් මෙම ඩිපෝවේ සහකාර කළමනාකරු ඉංජිනේරු වශයෙන් 2005 ජනවාරි මාසයේ සිට 2016.06.02 වැනි විටත් V නිලධාරී එස්.පී. දීප්ති කමල් මහතා සේවය කරනබව තහවුරු කර ඇත.

මේ අනුව ඉල්ලුම්කරු වන එච්.කේ.එන්.එස්. හේරත් මහතා විසින් ඉල්ලා ඇති වැඩ තහනම් කාලය වන මාස 11 ක් සඳහා හිඟ වැටුප් ගෙවීමටත්, එම කාලය තුළ ඔහුට හිමි උසස්වීම ආදිය සඳහාත් අදාළ විනය නියෝගය ඔහුට බලපා ඇතිනම් ඔහුගේ ජ්‍යෙෂ්ඨතාවය අනුව එම උසස්වීම ලබාදීමට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය කටයුතු කළ යුතු බව ට නිගමනය කරමි.

වැඩ තහනම් මාස 11 කාලය සඳහා වන්දි ගණන් බැලූ ආකාරය පහත දක්වමි. ඒ සඳහා හක්මණ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ කළමනාකරු විසින් 2018.02.06 හා අංක ශ්‍රීලංගම/හක්/මුකො/2018 දරන ලිපියේ ගණන් බැලූ ආකාරය නිවැරදි යන බව පෙනී යන හෙයින් ඒ අනුව පහත සඳහන් පරිදි අදළ ගණනය කිරීම් සිදු කර ඇති බව සඳහන් කරමි. (පිටු අංක 245 - 246)

(1) 2011 සැප්තැම්බර් මස සිට වෘත්තීය දීමනාව අතහැර

මසකට රු. 20015.75 බැගින් මාස 10 කට = රු. 200,157.50/-

2013 අප්‍රේල් මාසය සඳහා නැවත සේවය පිහිටුවීම හා
එම මස වැඩ තහනම් කළනිසා එම වැටුප ගෙවීම = රු. 28,393/-

**එකතුව** = රු. 2,28,550,50/-

**(රුපියල් දෙලක්ෂ විසිඅටදහස් පන්සිය පනහයි සත පනහයි)**

මෙම ප්‍රදානය කරනු ලබන්නේ ඉහත නිරීක්ෂණ හා නිගමන සැලකිල්ලට ගැනීමෙන් පසු එක් අතකින් නීතියද අනෙක් අතින් යුක්තිය හා සධාරණත්වය පදනම් කරගෙනය.

**ප්‍රදානය**

1. මේ අනුව 2011 සැප්තැම්බර් මස සිට 2012 ජූනි මස දක්වා වූ මාස 10 ක් සඳහා වෘත්තීය දීමනාව අත්හැර මසකට රු . 20,015.75 බැගින් V නිලධාරි එච්.කේ.එන්. එස්. හේරත් මහතාට ගෙවිය යුතු බවට නියෝග කරමි.

2. 2013 අප්‍රේල් මාසය සඳහා වෘත්තීය දීමනාව අත්හැර රු. 28393.00 ක් V නිලධාරි එච්.කේ.එන්.එස්. හේරත් මහතාට ගෙවිය යුතු බවට නියෝග කරමි.

3. ඉහත 1,2 එකතුව වන රු.228,550.50 (රුපියල් දෙලක්ෂ විසිඅටදහස් පන්සිය පනහයි සත පනහයි) ක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මීට පෙර හක්මණ ඩිපෝවේ සේවය කල දැනට තංගල්ල ඩිපෝවේ සේවය කරන V නිලධාරි එච්.කේ.එන්.එස්. හේරත් මහතාට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් මෙම ප්‍රදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඇති *විශේෂ ගැසට් පත්‍රයේ* පළවූ දින සිට මසක් ඇතුළත ගෙවිය යුතු බවට නියෝග කරමි. තවද එම මුදල මාතර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බවටද නියම කරමි.

4. එමෙන්ම V නිලධාරි එච්.කේ.එන්.එස්. හේරත් මහතාට හිඟ වැටුප් ගෙවීම අනුව ඔහුට හිමි සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාර අරමුදල් සහ පාරිතෝෂිත දීමනා අදී ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ හිමියවිය යුතු බව සඳහන් කරමි.

ඒ.බී. හේරත්,
බේරුම්කරු.

2023 ක් වූ පෙබරවාරි මස 22 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

EOG 03 - 0215

---

මගේ අංකය: IR/COM/01/2018/121.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2023.01.14 දිනැති හා අංක 2314/88 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.01.05 වැනි දින දරන නියෝග යෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1. හොරණ, යාලගල පාර, අංක 130බී හි පදිංචි ඒ. එල්. විජේසුන්දර මයා 2. හොරණ, යාලගල පාර, අංක 130බී හි පදිංචි එස්. පී. ඒ. කේ. ලංකා සමරකෝන් මිය සහ මල්වාන, වල්ගම, බියගම අපනයන සැකසුම් කලාපය, '' ඒ කොටස'' , ලොට් 15 හි පිහිටි ලූමියර් ටෙක්ස්ටයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.02.14 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ක් වූ මාර්තු මස 02 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

මගේ අංකය: IR/COM/01/2018/121

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය**

ඒ. එල්. විජේසුන්දර මයා,
අංක 130 බී,
යාලගල පාර,
හොරණ.

නඩු අංකය: A/15/2023

එස්. පී. ඒ. කේ. ලංකා සමරකෝන්
අංක 130 බී,
යාලගල පාර,
හොරණ.

පළමුවැනි පාර්ශ්වය

*එදිරිව*

ලුමියර් ටෙක්ස්ටයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලොට් 15 '' බ්ලොක් ඒ '',
බියගම අපනයන සැකසුම් කලාපය,
වල්ගම,
මල්වාන. (දෙවන පාර්ශ්වය) වග උත්තරකරු

**බේරුම්කරණ ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවෙන දරන පනත්වලින් සංශෝධිත ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිසංශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව ඉහත දෙපාර්ශ්වය අතර පැනනැගී ඇති ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මත්තෙගොඩ කුඩ මාදූව, ද විලේජ්, හි 202/B/61 පදිංචි නීතිඥ විජේසූරිය ආරච්චිගේ ජයවික්‍රම වන මා 2023 ජනවාරි මස 05 වැනි දින පත් කරනු ලැබීය.

ඒ අනුව කම්කරු කොමසාරිස් ජනරාල් බී. කේ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතාගේ අංක IR/COM/01/2018/121 හි 2023 ජනවාරි මස 02 දිනැති ලේඛනය මගින් ඉහත දෙපාර්ශ්වය අතර කාර්මික ආරාවුලට හේතු වී ඇති කරුණ වශයෙන් ලුමියර් ටෙක්ස්ටයිල්ස් ලිමිටඩ් (පසුව නම ලුමියර් ටෙක්ස්ටයිල්ස් ප්‍රයිවට් ලිමිටඩ්) ආයතනයේ සේවය කරන ලද ඒ. එල් විජේසුන්දර මහතා හට රියදුරු දීමනාව ප්‍රවාහන දීමනාව ඉන්ධන දීමනාව නොගෙවීම සහ එස්. පී. ඒ. කේ. ලංකා සමරකෝන් මිය හට ප්‍රවාහන දීමනාව ඉන්ධන දීමනාව නොගෙවීම මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන් දෙදෙනාට හිමිවිය යුතු සහන කවරේද? යන්න විසඳීම බේරුම්කරු වශයෙන් මා වෙත යොමු කර ඇත.

මෙම ආරාවුල විසඳීම සඳහා 2023.02.06 වැනි දින කම්කරු දෙපාර්තමේන්තුවේ බේරුම්කරණ අංශයට දෙපාර්ශ්වය කැඳවන ලදී.

එහිදී පළමු වන පාර්ශ්වයේ ඒ. එල් විජේසුන්දර මයා දැනට විදෙස් ගත බවත් ඔහුගේ අයිතිවාසිකම් වෙනුවෙන් ඔහුගේ භාර්යාව වන එස්. පී. ඒ. කේ. ලංකා සමරකෝන් මිය විශේෂ ඇටෝර්නි බලපත්‍රයකින් පත්කර ඇති බවත් දන්වා සිටී. ඒ අනුව ප්‍රසිද්ධ නොතාරිස් බී. එච්. හේමරත්න පෙරේරා මහතා 2021.12.21 දින සහතික කළ අංක 36563 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය ඉදිරිපත් කළ අතර එය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ කළුතර දිස්ත්‍රික් කාර්යාලයේ අංක 1160/96 යටතේ 2021.12.23 වැනි දින ලියාපදිංචි කර ඇති බව තහවුරු විය. එම ඇටෝර්නි බලපත්‍රය අනුව මෙම ආරාවුලට අදාළ අංක A/42/2021 ලෙස දැක්වුවද එය මා ඉදිරිපිට කැඳවා ඇති A/15/2023 බව දෙපාර්ශ්වය පිළිගනී.

මෙම කාර්මික ආරාවුල අනුව පළවුවැනි පාර්ශ්වකාර ඒ. එල්. විජේසුන්දර මහතාට රියදුරු දීමනාව,ප්‍රවාහන දීමනාව හා ඉන්ධන දීමනාව වශයෙන් රු. 4303 700.00 මුදලක් ද එස්. පී. කේ. ලංකා සමරකෝන් මියට ප්‍රවාහන දීමනාව හා ඉන්ධන දීමනාව ලෙස රු. 3092685.00 මුදලක් ද වගඋත්තරකාර පාර්ශ්වයෙන් අය විය යුතු බව කියා සිටී. වගඋත්තරකාර පාර්ශ්වය එම දෙදෙනාට හිමිවිය යුතු මුදල පිළිගනී

පැමිණිලිකරුවන් දෙදෙනාට හිමිවිය යුතු මුදල හැත්තෑ තුන් ලක්ෂ අනූ හයදහස් තුන්සිය අසූ පහ රු. 73,96,385.00 (4,303,700 + 3092685.00) වුවද සමස්ථයක් වශයෙන් මෙම මුදල රුපියල් මිලියන හතරකට අඩු කිරීමට පැමිණිලිකාර පළමුවන පාර්ශ්වය එකඟ වේ. වගඋත්තරකාර දෙවන පාර්ශ්වයද සමස්ථයක් වශයෙන් එකී රුපියල් මිලියන හතරක (රු. 4,000,000/) මුදල ගෙවීමට එකඟ වේ.

ඉහත දක්වූ ඇටෝර්නි බලපත්‍රය අනුව පළමුවන පැමිණිලිකාර ඒ. එල්. විජේසුන්දර මයාගේ ඇටෝර්නි බලකරු වන්නේ දෙවන පැමිණිලිකාර එස්. පී. ඒ. කේ ලංකා සමරකෝන් මිය වන හෙයින් ඉහත සඳහන් කල සමතය අනුව ඇයට දෙදෙනා වෙනුවෙන්ම වූ මාසික වාරික මුදල වන රු. 2,00.000/ බැවින් සම්පූර්ණ වන රුපියල් මිලියන හතරක් ගෙවීමට දෙවන පාර්ශ්වය එකග වේ.

ඒ අනුව මෙම නඩුවේ ප්‍රශ්නගත මුදල රුපියල් හැත්තෑ තුන් ලක්ෂ අනූ හයදහස් තුන්සිය අසූ පහ (73,96,385/-) සිට රු. මිලියන 4 දක්වා (4,000,000) අඩු කිරීමත් එම රු. 4,000,000/ ක මුදල දෙවන පාර්ශ්වය විසින් 2023.03.15 දින සිට පළමුවන පාර්ශ්යට පහත පරිදි ගෙවීමටත් එකඟ වේ.

1. වග උත්තර කරුවන් විසින් ගෙවිය යුතු මුලු මුදල - රු 4,000,000 (රු. මිලියන හතරකි)
2. මාසික වාරික - රු 2,00,000 (ලක්ෂ දෙකයි)
3. වාරික ගණන - වාරික විස්සයි (20)
4. ගෙවීම අරම්භ වන දිනය - 2023.03.15
5. ගෙවීම අවසන් වන දිනය - 2024.10.15
6. ගෙවීම් කළ යුතු ස්ථානය - මාසික වාරිකය නියමිත දින හෝ ඊට පෙර මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතුයි.

ඉහත සඳහන් දෙපාර්ශ්වය බේරුම්කරු ඉදිරියේ අද දින එළඹි එකගතාවය සාධාරණය හා යුක්ති සහගත බව තීරණය කරමි.

නීතිඥ ඩබ්. ඒ ජයවික්‍රම,
බේරුම්කරු.

EOG 03-0216

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.